## විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

## මාධ්‍ය නිවේදනය

## සංචාරක උදාව 2026

### ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයේ දැවැන්තම ප්‍රදශර්නය වන ‘සංචාරක උදාව’ 13 වැනි සංස්කරණය උත්කෂර්වත් ලෙස ආරම්භ වෙයි

**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව (BMICH), කොළඹ**

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සංචාරක සහ සංචාරක ප්‍රදශර්නය වන ‘සංචාරක උදාව 2026’ හි 13 වැනි සංස්කරණය මැයි මස 15 වැනිදා කොළඹ BMICH හි පිහිටි සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රදශර්න මධ්‍යස්ථානයේදී උත්කෂර්වත් ලෙස සමාරම්භ කරන ලදී. සජීවී ප්‍රදශර්න, ව්‍යාපාරික ජාලකරණය සහ දැනුම හුවමාරු කර ගැනීම වෙනුවෙන් දින දෙකක කාලයක් පුරා විහිදෙන මෙම ප්‍රදශර්නයේ සමාරම්භය රටේ සංචාරක දින දශර්නයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

මෙම සමාරම්භක උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස ගරු අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිණිය සහභාගී වූ අතර, ගරු කම්කරු අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත සහ ගරු සංචාරක නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය රුවන් රණසිංහ යන මහත්වරු ද ඊට එක්වූහ. ඔවුන්ගේ සහභාගීත්වය මඟින් ශ්‍රී ලංකාවේ සංචාරක කමර්ාන්තය ශක්තිමත් කිරීමට සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සබල ගන්වන මෙවැනි වේදිකාවන් දිරිමත් කිරීමට රජය සතු නොසැලෙන කැපවීම මැනවින් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවධර්න කායර්ාංශයේ (SLTPB) සහයෝගීතාවයෙන්, ශ්‍රී ලංකා සංචාරක නියෝජිතයන්ගේ සංගමය (SLAITO) විසින් සංවිධානය කරනු ලබන ‘සංචාරක උදාව 2026’ ප්‍රදශර්නය සඳහා සංචාරක ක්ෂේත්‍රයේ සෑම අංශයක්ම නියෝජනය කරමින් ප්‍රදශර්කයන් 250 කට අධික සංඛ්‍යාවක් සහ කුටි 300 කට වඩා ඇතුළත් වේ. මෙවර ප්‍රදශර්නයේ විශේෂත්වයක් වන්නේ, ප්‍රථම වතාවට විදේශීය ගැනුම්කරුවන්ට (foreign hosted buyers) මෙහි සත්කාරකත්වය සැපයීමයි. එමඟින් දේශීය සංචාරක ක්ෂේත්‍රයේ කොටස්කරුවන්ට ජාත්‍යන්තර වෙළඳපොළ සමඟ සෘජුව සම්බන්ධ වීමට පෙර නොවූ විරූ අවස්ථා උදාවේ.

දේශීය සේවා සපයන්නන්ගේ ධාරිතා වධර්නය, යටිතල පහසුකම් නැංවීම සහ සන්නාම ප්‍රවධර්නය (brand visibility) වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රය දක්වන දායකත්වය මෙම සමාරම්භක උත්සවයේදී අවධාරණය කෙරිණි. සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය දෙපාතර්මේන්තු සඳහා නොමිලේ ප්‍රදශර්න කුටි පිරිනැමුණු අතර, දිවයිනේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාල සමඟ ඇති කරගත් හවුල්කාරිත්වය හේතුවෙන් තරුණ සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍රයේ දායකත්වය ඉහළ මට්ටමක පැවතිණි. මෙයින් සංචාරක ක්ෂේත්‍රයේ අනාගතය හැඩගැස්වීම සඳහා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට මීළඟ පරපුර බලගැන්වීම අපේක්ෂා කෙරේ.

මෙම අවස්ථාවට තවදුරටත් අභිමානයක් එක් කරමින්, ප්‍රමුඛ පෙළේ අනුග්‍රාහකයන් රැසක් ද එක්ව සිටියහ. ඒ අනුව, 'යුනයිටඩ් මෝටසර්' (United Motors) සහ 'අරලිය හෝටල් සමූහය' (Araliya Group of Hotels) දියමන්ති අනුග්‍රාහකයන් (Diamond Sponsors) ලෙස ද, 'හිල්ටන් කොළඹ' (Hilton Colombo) නිල ආගන්තුක සත්කාරක සහකරු ලෙස ද, 'ගල්කිස්ස මහ හෝටලය' (Mount Lavinia Hotel) ආහාරපාන සැපයීමේ සහකරු ලෙස ද එක් විය. ඔවුන්ගේ දායකත්වය ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයේ පවතින ශක්තිය සහ එකමුතුකම මැනවින් විදහා දක්වන්නකි.

නිල සමාරම්භක උත්සවයෙන් අනතුරුව, ප්‍රදශර්නය මැයි 16 වැනිදා දක්වා පැවැත්වෙන අතර, එහිදී ක්ෂේත්‍රයේ සහයෝගීතාවය සහ දැනුම හුවමාරුව අරමුණු කරගත් B2B සාකච්ඡා, මණ්ඩල සාකච්ඡා (panel discussions) සහ වැඩමුළු රැසක් පැවැත්වීමට නියමිතය. ‘සංචාරක උදාව 2026’ හි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශීය සංචාරක සේවා සපයන්නන් සඳහා වන වෙන් කිරීම් (bookings) සැලකිය යුතු ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, ශ්‍රී ලංකාව විවිධත්වයෙන් පිරි, ප්‍රථාන්න සංචාරක ගමනාන්තයක් ලෙස නැවත වරක් තහවුරු වනු ඇත.

රටේ ගෝලීය ප්‍රතිරූපය ඉහළ නැංවීමට, ක්ෂේත්‍රයේ වධර්නය උදෙසා සහ රජය, ශාස්ත්‍රීය ක්ෂේත්‍රය මෙන්ම පෞද්ගලික අංශයේ කොටස්කරුවන් අතර සබඳතා ශක්තිමත් කිරීමට ඉවහල් වන මෙවැනි සන්ධිස්ථානීය ඉසව් සඳහා අඛණ්ඩව සහයෝගය දැක්වීමට ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රය සැමවිටම කැපවී සිටී

**මාධ්‍ය ඒකකය,**

**නිකුත් කළ දිනය : 2026/05/15** **යොමු අංකය : MOT/ DMO/PR/M2**